ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

------------------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

------

**මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව,** ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය 2010 **දෙසැම්බර්** 31 **දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ** 1.2 **ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර** 2010 **දෙසැම්බර්** 31 **දිනට** ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ **ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.**

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

----------------------------------------

1.2.1 **ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම්**

--------------------------------------------

**ගිණුම්කරණ ප්‍රමිත** 37 **අනුව පර්යේෂණ හා සංවර්ධන වියදම් වර්ගකර ඉදිරිපත් කළ යුතු වුවත් ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල** රු.38,727,358 **ක් වූ පර්යේෂණ හා සංවර්ධන වියදම් එක් විෂයයක් යටතේ දක්වා තිබුණි.**

1.2.2 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

------------------------

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) **ආයතනයේ බොල් හා අඩමාණ ණය වෙන්කිරීමේ පතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.**

(ආ) **වර්ෂ** 03 **කට වඩා වැඩි කාලයක සිට ආපසු නොගෙවන ලද ඇප තැන්පතු ප්‍රමාණය වූ** රු.22,582 **සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත්කර ඇති ප්‍රතිපත්ති** 6.5 **ට අනුව කටයුතු කර නොතිබුණි.**

1.2.3 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

ගිණුම්කරණ මෘදුකාංගයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් ගෙවා ඇති රු.272,160 ක ප්‍රමාණය අත්තිකාරම් ලෙස ගිණුම්ගතකර තිබියදී උපචිත වියදම් වශයෙන්ද ගිණුම්ගත කර තිබුණි.

1.2.4 **නොසැසදීම්**

-------------

අවසන් තොග විෂයයන් 06 ක් සම්බනධයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ හා ගබඩාවේ ඇති උපලේඛන අනුව ශේෂය අතර රු.118,664 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.5 **ලැබිය යුතු ගිණුම්**

------------------

ඉදිරිපත් කරන ලද ණයගැති කාල විශ්ලේෂණය අනුව දීර්ඝ කාලයක සිට අය නොවී පවතින ශේෂවල වටිනාකම රු.3,481,869 ක් වු අතර, ඉන් වටිනාකම රු.2,074,142 ක් අවුරුදු 5 ට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින ශේෂයන් වු අතර, මෙම ප්‍රමාණය ණය ගැතියන්ගෙන් 60% ක් වී තිබුණි.

1.2.6 **ගෙවිය යුතු ගිණුම්**

------------------

(අ) ඉදිරිපත් කරන ලද ණය හිමි කාල විශ්ලෙෂණය අනුව දීර්ඝ කාලයක සිට ගෙවීමට ඇති ශේෂවල වටිනාකම රු.11,725,333 ක් වු අතර, ඉන් වටිනාකම රු.2,051,566 ක් අවුරුදු 4 ට වඩා වැඩි කාලයක සිට ගෙවීමට ඇති ශේෂයන් වු අතර , මෙම ප්‍රමාණය මුළු ණය හිමියන්ගෙන් 17% ක් වී තිබුණි.

(ආ) වර්ෂ 02 කට වැඩි කාලයක සිට හිමිකම් නොපාන ලද එකතුව රු.87,212 වු ගෙවීම් ආදායමට නොගෙන දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

1.2.7 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

පහත සඳහන් සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම ගිණුම් විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට විගණනයේ දී නොහැකි විය.

(අ) පිරිවැය රු.48,026,184 ක වු මෝටර් වාහන සම්බන්ධයෙන් දරන ලද නඩත්තු වියදම් , වාහන 10 ට අදාල අපහරණයන් හා වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් වු ලිපි ගොනු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂයෙ දී බඳවා ගන්නා ලද පර්යේෂණ නිලධාරීන් 14 ක් සම්බන්ධයෙන් වු බඳවා ගැනීමේ ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) කල්පිටිය කාර්යාලයේ කම්බි වැටක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දරණ ලද රු.1,323,844 ක් වු වියදම සඳහා වු ලිපිගොනුව විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

### 1.2.8 නීති.රීති රෙගුලාසි සහ කළමණාකරන තීරණවලට අනුකුල නොවීම්

විගණනයෙදී නිරීක්ෂණය වූ අනුකුල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | අනුකුල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 (6) වගන්තිය | අදාල අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය නොලබා රු.5,017,574 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2. මුල්‍ය හා මෙහෙයුම් සමාලොචනය

### 2.1 මුල්‍ය සමාලෝචනය

### 2.1.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නියෝජ්තායතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 39,167,043 ක ඌනතාවයක් වු අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රුපියල් මිලියන 30,039,707 ක් වුයෙන් , මුල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 9 ක ඌනතාවයේ වර්ධනයක් පෙන්නුම් කර ඇත.ආදායම අඩුවීමක්, පර්යේෂණ වියදම් හා අළුත්වැඩියා වියදම් වැඩිවීමත් මීට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 2.2.1 කාර්ය සාධනය

---------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කළ පර්යේෂණ සංඛ්‍යාව 29 ක් වන අතර ඉන් 100% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත්තේ පර්යේෂණ හතරක් පමණි.

(ආ). ඇතැම් පර්යේෂණවල භෞතික ප්‍රගතිය කරා ලඟාවීමටත් ප්‍රථම එම පර්යේෂණ සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදනය අපේක්ෂිත ඉලක්කය ඉක්මවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ පර්යේෂණ 29 හි මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

| මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය | පර්යේෂණ සංඛ්‍යාව |
|---|---|
| % | |
| 100 ඉක්මවා වියදම් කළ (අපේක්ෂිත ඉලක්ක ඉක්ම වූ ) | 7 |
| 100-80 | 3 |
| 79-60 | 10 |
| 59-40 | 6 |
| 40 ට අඩු | 3 |
| | ----- |
| **එකතුව** | 29 |
| | === |

ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ හා වියදම් කළමනාකරණයේ දුර්වලතා පවතින බව මෙහිදී නිරීක්ෂණය කෙරේ.

### 2.2.2 කළමනාකරණ ආකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ආයතනයේ සේවකයන් වෙත ලබාදී තිබූ පොත් ණය , පාපැදි ණය හා ආපදා ණය රු.5,584 ක මුදලක් සේවකයින්ගෙන් අයකර ගැනීමට ක්‍රියා නොකර බොල් හා අඩමාණ ණය ලෙස වෙන් කර තිබුණි.

(ආ) සේවකයින් 7 දෙනෙකුට ලබාදී තිබූ අපෂාණය ශේෂය වූ රු.204,875 ක් අදාල සේවකයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන් වෙත මුදාහරින ලද නිලධාරින් වෙනුවෙන් නියෝජ්තායතනය විසින් සමාලෝචිත වර්ෂයේදීද රු.1,285,604 ක මුදලක් වැටුප් ලෙස හා ගමන් වියදම් වශයෙන් රු.325,924 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) වර්ෂ කිපයක සිට වෙළඳපල මිල ගණන් කැඳවීමකින් තොරව ආයතනයේ ආරක්ෂක සේවා සැපයීම ධීවර වරාය නිතිගත සංස්ථාවෙන් ලබාගෙන තිබුණ අතර , සමාලෝචිත වර්ෂයේ එම සේවා සැපයීම වෙනුවෙන් රු.4,418,684 ක මුදලක් ගෙවා තිබුණි. වෙළඳපල මිල ගණන් ඉක්මවා සේවා ලබාගෙන තිබූ අතර ආයතනයෙන් අවශ්‍යතාවය නොවිමසා ආරක්ෂක නිලධාරින් සේවයේ යොදවා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල අනතුරට භාජනය වී තිබූ වාහන දෙකකට අදාල අලාභයන් වෙනුවෙන් රක්ෂණ හිමිකම් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 හඳුනාගත් පාඩු

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නියමිත දිනට පෙර ජල බිල්පත් ගාස්තු නොගෙවීම හේතුවෙන් රු.57,198 ක් වූ වට්ටම් වටිනාකම ලබාගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) ආයතනය ආදායම් බදු නිදහස ලබාගෙන තිබුණද , බාහිර පාර්ශව වෙත ලබාදී තබූ සේවාවන් මත රඳවා ගැනීම් බදු ලෙස රු.969,607 ක මුදලක් සේවා ආදායමෙන් අඩුකර ගැනීමට ඉඩහැර තිබුණි.

2.2.4 අරමුණුවලට පටහැනි ගෙවීම්

------------------------------

නියෝජ්තායතනය පිහිටුවීමේ අරමුණුවලින් බාහිර අරමුණු සඳහා පහත වියදම් දරා තිබුණි.

(අ) සාදයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.589,688 ක වියදමක් දරා තිබුණි.

(ආ) කාර්ය මණ්ඩලයේ සේවකයන් ආයතනික සේවා වලින් නිදහස් කොට ආපනශාලාව හා වාඩිය පවත්වාගෙන යාම සඳහා පාලනාධිකාරිය විසින් යොදවා තිබූ අතර වැටුප් හා අතිකාල ලෙස එම සේවකයන් සඳහා රු.559,035 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

### 2.2.5 නිෂ්කාර්ය සම්පත්

---------------------

වසර 05 කට වඩා වැඩි කාලයක සිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට නොගන්නා ලද බැංකු ජංගම ගිණුම් 04 ක රු. 12,959 ක මුදලක් නිෂ්කාර්ය ලෙස රඳවා ගෙන තිබුණි.

### 2.2.6 මානව සම්පත් කළමණාකරනය

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු**

-----------------------------------------

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| විස්තර | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| මාණ්ඩලික | 40 | 25 | 15 |
| මාණ්ඩලික නොවන | 354 | 282 | 72 |
| එකතුව | 394 | 307 | 87 |

### 3. පද්ධති හා පාලන

--------------------

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපති වෙත දන්වා යවන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වාහන නඩත්තුව
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) ඉදිකිරීම් කොන්ත්‍රාත්
(ඈ) ලැබිය යුතු ශේෂ
(ඉ) ගෙවිය යුතු ශේෂ